# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,478 - 2026 පෙබරවාරි මස 27 සිකුරාදා - 2026.02.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු … … | 866 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | 913 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 20 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 06 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2026 ජනවාරි මස 01 දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


863 - B 82767 - (2026/02)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ෂඩ් වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික - බණ්ඩ 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2026

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික - බණ්ඩ 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරි තනතුරේ පවතින පුරප්පාඩු සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික - බණ්ඩ 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරි තනතුර සඳහා වේ. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.03.27** දින වේ.

02. සේවා කොන්දේසි :

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, අංක 1986/2 දරණ හා 2016.09.26 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලැබූ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ ඒකාබද්ධ සේවයේ සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක: 2310/29 හා 2022.12.14 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ක්‍රීඩා නිලධාරි තනතුරු සඳහා පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද, අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරින්, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. කළමනාකරණ සහකාර - තාක්ෂණික - බණ්ඩ 2 සේවා ගණයේ (MT 02 - 2025) ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඈ) තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

(ඉ) තනතුරට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| ක්‍රීඩා නිලධාරි | III | 18 | 1. ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන විධිමත්ව පවත්වාගෙන යාම.<br>(i) පුහුණු මධ්‍යස්ථානයට ලබා දී තිබෙන සියලුම ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ නඩත්තු කිරීම.<br>(ii) පුහුණු මධ්‍යස්ථානයට අයත් සෙසු භාණ්ඩ හා දේපළ ආරක්ෂා කිරීම.<br>2. ක්‍රීඩා පුහුණු කිරීම් ඉදිරි වැඩසටහන් අනුව පවත්වාගෙන යාම.<br>3. ක්‍රීඩා විෂයට අදාල සැලසුම්. |

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| | | | 4. (i). ක්‍රීඩක ජීව දත්ත වාර්තා<br>(ii). ක්‍රීඩක කුසලතා වාර්තා<br>(iii). පර්යේෂණ වාර්තා<br>(iv). ක්‍රීඩා පැමිණීමේ ලේඛන - පවත්වාගෙන යාම.<br><br>5. ක්‍රීඩා තරග, පුහුණු කඳවුරු සංවිධානය හා තරඟ විනිශ්චය.<br><br>6. ක්‍රීඩා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතියට යටත්ව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව හෝ වෙනත් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන පිළිගත් ආයතන විසින් පවත්වනු ලබන ක්‍රීඩා ව්‍යාපෘතීන් සඳහා සහාය හා උපදෙස් ලබා දීම. |

03. මාසික වැටුප් පරිමාණය:

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 චක්‍රලේඛය අනුව, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික - ඛණ්ඩ 2 සේවා ගණයේ (MT 02) ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය

**(MT 02 - 2025) රු. 50,630-10 x 630-11 x 670 - 10 x 1,010- 10 x 1,190 - රු. 86,300/=**

(ආරම්භක වැටුප් පියවර - රුපියල් 50,630.00) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් :

(*අ*) අධ්‍යාපන සුදුසුකම් :

I. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා ගෙන තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර);

*සහ*

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරගයන්හී දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1,2, හෝ 3 ස්ථාන ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරගවල 1,2 හෝ 3 ස්ථාන ලබා තිබීම;

*හෝ*

(*ආ*)

I. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

II. දකුණු ආසියාතික තරග, ආසියාතික තරග, පොදු රාජ්‍ය මණ්ඩලීය තරග, ඔලිම්පික් තරග, ලෝක ශූරතා තරග සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර 1,2 හෝ 3 ස්ථාන සඳහා පදක්කම් ලබා තිබීම.

ඉහත සඳහන් සුදුසුකම් යටතේ බඳවා ගන්නා නිලධාරීන් වසර 3 ක් ඇතුළත තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා (NVQ 06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට

අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් පළමු වසර තුන (03) තුළ ලබා නොගන්නා නිලධාරින්ගේ සේවය පරිවාස කාලය අවසානයේ දී ස්ථිර නොකරන අතර ඔවුන්ගේ වැටුප් වර්ධක විලම්භනය කරනු ලැබේ. එලෙස වැටුප් වර්ධක විලම්භනය කිරීමට භාජනය වූ නිලධාරියකු එසේ වැටුප් වර්ධක විලම්භනය කරන ලද දින සිට වසර දෙකක (02) කාලයක් තුළ ජාතික වෘත්තීය කුසලතා (NVQ 06) මට්ටමේ වන්නා වූ ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ තාක්ෂණික ඩිප්ලෝමාවක් ලබා ගැනීමට අසමත්වන්නේ නම් ඔහුගේ පත්වීම ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අකාර්යක්ෂමතාව මත අවසන් කරනු ලැබේ.

(ඇ) පළපුරුද්ද :

අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඈ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඈ) වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026.03.27 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතු ය.

(ඉ) වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

වෘත්තීය පරීක්ෂණයක් හා යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

(අ) වෘත්තීය පරීක්ෂණය :

ශාරීරික යෝග්‍යතාව පිරික්සීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය පහත අංශයන්ගෙන් සමන්විතය. ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෙඅත්වල ශක්තිය, උලභිතාවය, හිටිදුර පැනීම, වේගය දරා ගැනීම.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| 02. ක්‍රීඩා දක්ෂතාවයන් | 70 | |
| 03. ක්‍රීඩා පුහුණු කිරීම්, තරග විනිශ්චය/ තරග සංවිධානය පිළිබඳ අතිරේක පළපුරුද්ද | 15 | |
| 04.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | 05 | |
| **එකතුව** | **100** | |

සුදුසුකම් සනාථකරනු ලබන සහතික පරීක්ෂා කිරීමද, යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ම සිදුකරනු ලැබේ.

*සටහන :*

i. වෘත්තීය පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ii. ඉහත වගුවේ දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, එක් එක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පටිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධාරියා විසින් සිදු කරනු ඇත.

iii. යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණ ඛණ්ඩ 2 (MT – 02 – 2025) සේවා ගණයේ III ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරි තනතුරට බඳවා ගනු ලැබේ.

06. පත්වීම් ලබා දීම : පුරප්පාඩු සංඛ්‍යාව 18 කි.

i. පුරප්පාඩු සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 (II) අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

ii. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික - ඛණ්ඩ 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර තෝරා ගන්නා අපේක්ෂකයින් අතරින් අයකු යම් කරුණක් හේතුවෙන් පත්වීම භාර නොගැනීම හෝ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වුවහොත්, කුසලතා අනුපිළිවෙළ අනුව අනෙකුත් අපේක්ෂකයින් තෝරා පත් කිරීම ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

07. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා සේවයට බැඳීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ය.

(ආ) සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් අයදුම්පත් ඉදිරිපත් කරන්නන් අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් තනතුරු නාමය එම භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතු ය.

(ඇ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය 8 ½ " x 12" (ඒ4) කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. පරිගණකයෙන් සකස් කරන ලද අයදුම්පත්ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 11 තෙක් පළමු පිටුවටද, අංක 12 සිට 15 දක්වා දෙවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවට ද ඇතුලත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතු ය.

(ඈ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.03.27** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි "අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික - ඛණ්ඩ 2 (MT 02) සේවා ගණයේ ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීම - 2026" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතුය. **2026.03.27** දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික කරන ලද ඡායා පිටපත් අයදුම් පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) *අත්සන සහතික කිරීම* - දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙක්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, එවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු. 782,808/-ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජා ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරනකෙනෙකු විය යුතු ය.

(ඊ) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(උ) අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ පිළිබඳව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ දුරකතන අංක 011 2694566 හෝ 011 2697934 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකිය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද තනතුරේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය.

(ඌ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/ මණ්ඩල/ සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

*සටහන* - අයදුම්කරුවෙකු වෘත්තීය පරීක්ෂණයට කැඳවීම හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පත්වීම ලබාදීම සඳහා සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් වෘත්තීය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන කාලයේදී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. වෘත්තීය හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

යෝග්‍යතා පරීක්ෂණයේ දී අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(I) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත; හෝ

(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. වෙනත් කරුණු :

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්.අච්චුදන්,
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

2026 පෙබරවාරි 27 දින,
අංක.09,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික - බණ්ඩ 2 සේවා ගණයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම - 2026

Recruitment to the post of Management Assistant– Technical Segment 2 Sports Officer of the Department of Sports Development – 2026

01. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKE)
....................................................................................................................................
....................................................................................................................................

02. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: H.M.S. RATHNAYAKE)
..............................................................................................................................................
..............................................................................................................................................

03. සම්පූර්ණ නම (සිංහලෙන්) :
..............................................................................................................................................
..............................................................................................................................................

04. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
..............................................................................................................................................
..............................................................................................................................................

05. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
..............................................................................................................................................
..............................................................................................................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|

07. ස්ත්‍රී/පුරුෂභාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ - 0
ස්ත්‍රී - 1

08. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|

09. විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය : ……………………………………………………………………………......

10. උපන් දිනය :
වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු: [ ][ ][ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

12. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා.පෙළ)

විභාග වර්ෂය :

විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (උ.පෙළ)

විභාග වර්ෂය :
විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14. සේවා පළපුරුද්ද (පූර්ව සේවා කාලය සහ ආයතන පිළිබඳ විස්තර) :

| සේවා කාලය | | පදවි නාමය | සේවා ස්ථානය |
|---|---|---|---|
| සිට | දක්වා | | |
| I. ................. | ................. | ...................................... | ................................................ |
| II. ................. | ................. | ...................................... | ................................................ |
| III. ................. | ................. | ...................................... | ................................................ |

15. වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

16. ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ක්‍රීඩා ක්ෂේත්‍රෙය් දී දක්වන ලද විශේෂ දක්ෂතා :

| වර්ෂය | තරඟාවලිය | දක්වන ලද දක්ෂතාවය |
|---|---|---|
| | | |
| | | |
| | | |

17. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න.) ඔව් නම් විස්තර සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

..................................................................................................................................................................

18. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.................................................................
අත්සන

දිනය : ...........................................

19. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................................... නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ................................. මස .....................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ..........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ..........................................................................................
තනතුර : ..........................................................................................
ලිපිනය : ..........................................................................................
(නිල මුද්‍රාව)

දිනය : ....................................

***සටහන :*** අයදුම්පත සහතික කළයුත්තේ ගැසට් නිවේදනයේ 07 ඡේදයේ (ඉ) වගන්තියේ සඳහන් පරිදිය.

20. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .............................................................................. නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියතු අයකු වන අතර ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

..................................................... නිල මුද්‍රාව :
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .......................................

ආයතන ප්‍රධානියාගේ නම : ..........................................................................
තනතුර : ..........................................................................
සේවා ස්ථානයේ ලිපිනය : ..........................................................................

02 - 456/1

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ ව්‍යායාම් සහකාර තනතුර සඳහා බඳවා ගැනීම - 2026

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ ව්‍යායාම් සහකාර තනතුරේ පවතින පුරප්පාඩු සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ ව්‍යායාම් සහකාර තනතුර සඳහා වේ. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.03.27** දින වේ.

02. සේවා කොන්දේසි :

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, 2014.02.21 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක: 2310/29 හා 2022.12.14 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු ව්‍යායාම් සහකාර තනතුරු සඳහා පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද, අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරින් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ (MN 01) ව්‍යායාම් සහකාර III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(ඈ) තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

(ඉ) තනතුරට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| ව්‍යායාම් සහකාර | III | 08 | 1. ශාරීරික යෝග්‍යතාව හඳුනාගෙන ගැළපෙන පරිදි ශාරීරික ව්‍යායාම් සැලසුම් කිරීම හා ප්‍රායෝගිකව පුහුණු කිරීම.<br><br>2. යන්ත්‍රෝපකරණ මනා පාලනයකින් පවත්වාගෙන යාම.<br><br>3. යන්ත්‍රෝපකරණ සේවා කිරීම් නඩත්තුව හා අළුත්වැඩියා කටයුතු පිළිබඳව නිසි පරිදි දැනුම් දීම.<br><br>4. නිවැරදි ගාස්තු අය කිරීම, ලියා පදිංචි කිරීම, නිවැරදිව ගිණුම්ගත කිරීම.<br><br>5. ජාතික සංචිත හා වෙනත් ක්‍රීඩා අවශ්‍යතා නිසි පරිදි වෙන් කිරීම් හා ලේඛන නිසි පරිදි පවත්වාගෙන යාම. |

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| | | | 6. ක්‍රීඩා වෛද්‍ය ආයතනය සමඟ සම්බන්ධීකරණ පවත්වා ගනිමින් පෝෂණ අවශ්‍යතා සඳහා උපදෙස් ලබා දීම.<br><br>7. ආබාධ තත්ත්වයෙන් පෙළෙන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ශාරීරික අභ්‍යාස ව්‍යාපෘති මාලාවක් සකස් කිරීම හා පුහුණු කිරීම. |

03. මාසික වැටුප් පරිමාණය:

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 චක්‍රලේඛය අනුව, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ (MN 01) ව්‍යායාම් සහකාර III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය

**(MN 01 - 2025)** රු. **45,230 - 10 x 540- 11 x 630- 10 x 890 - 10 x 1,190 -** රු. **78,360/=**

(ආරම්භක වැටුප් පියවර - රුපියල් 45,230.00) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම් :

(අ) අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම ;

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් එක් විෂයකින් හෝ (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ආ) වෘත්තීය සුදුසුකම් :

ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.
ශාරීරික යෝග්‍යතාව පිළිබඳ සති 02 කට වඩා වැඩි පුහුණු පාඨමාලාවක් හදාරා තිබිය යුතුය.

(ඇ) පළපුරුද්ද :

අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(ඈ) කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඉ) වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසකම් **2026.03.27** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතු ය.

(ඉ)වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මඟින් තෝරාගනු ලැබේ.

යෝග්‍යතා ඇඟයීමේ හා ප්‍රායෝගික පරීක්ෂණය ;

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 15 | අදාළ නොවේ |
| 02. ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද හා ක්‍රීඩා පිළිබඳ දක්ෂතාවය | 30 | |
| 03. ශාරීරික යෝග්‍යතාවය | 20 | |
| 04. වෘත්තීය සුදුසුකම් | 30 | |
| 05.සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරන කුසලතාව, නායකත්වය, ආකල්ප, පෞරුෂත්වය හා සංනිවේදන කුසලතා | 05 | |
| **එකතුව** | **100** | |

06. පත්වීම් ලබා දීම :

i. පුරප්පාඩු සංඛ්‍යාව 08 කි.
පුරප්පාඩු සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් සිටින අවස්ථාවකදී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 (II) අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරනු ලැබේ.

ii. යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ව්‍යායාම් සහකාර III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර තෝරා ගන්නා අපේක්ෂකයින් අතරින් අයකු යම් කරුණක් හේතුවෙන් පත්වීම භාර නොගැනීම හෝ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වුවහොත්, කුසලතා අනුපිළිවෙළ අනුව අනෙකුත් අපේක්ෂකයින් තෝරා පත් කිරීම ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.

07. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා සේවයට බැදීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන්ය.

(ආ) සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් අයදුම්පත් ඉදිරිපත් කරන්නන් අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් තනතුරු නාමය එම භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන්ද සඳහන් කළ යුතුය.

(ඇ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය 8 ½ " x 12" (ඒ4) කඩදාසියක සකස්කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය. පරිගණකයෙන් සකස් කරන ලද අයදුම්පත්ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 11 තෙක් පළමු පිටුවටද, අංක 12 සිට 15 දක්වා දෙවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවටද ඇතුලත්වන පරිදි අයදුම්පත සකස් කළ යුතු ය.

(ඇ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.03.27** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි "අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ව්‍යායාම් සහකාර III ශ්‍රේණියට බඳවා ගැනීම - 2026" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. 2026.03.27 දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික කරන ලද ඡායා පිටපත් අයදුම් පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

(ඉ) අත්සන සහතික කිරීම - දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙක්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතු ය. එනම් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු. 782,808/-ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

(ඊ) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(උ) අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ පිළිබඳව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ දුරකතන අංක 011 2694566 හෝ 011 2697934 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකිය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද තනතුරේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය.

(ඌ) ආණ්ඩුවේදෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථාආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

*සටහන* **-** අයදුම්කරුවෙකු යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පත්වීම ලබාදීම සඳහා සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වන කාලයේ දී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමකින් යටපත්කර ඇත්නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

යෝග්‍යතා පරීක්ෂණයේදී අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පුකර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(I) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

*හෝ*

(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. වෙනත් කරුණු :

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්.අච්චුදන්,
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

2026 පෙබරවාරි 27 දින,
අංක.09,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

*ආදර්ශ අයදුම්පත*

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ව්‍යායාම් සහකාර තනතුර සඳහා බඳවා ගැනීම - 2026

Recruitment to The Post of Management Assistant Non – Technical Segment 2 Exercise Assistant of the Department of Sports Development – 2026

01. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKE)
.....................................................................................................................................
.....................................................................................................................................

02. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: H.M.S. RATHNAYAKE)
.....................................................................................................................................
.....................................................................................................................................

03. සම්පූර්ණ නම (සිංහලෙන්) :
.....................................................................................................................................
.....................................................................................................................................

04. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....................................................................................................................................
.....................................................................................................................................

05. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
.....................................................................................................................................
.....................................................................................................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

07. ස්ත්‍රී/පුරුෂභාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

| | | | |
|---|---|---|---|
| පුරුෂ | - | 0 | |
| ස්ත්‍රී | - | 1 | |

08. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

09. විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය : ..............................................................................................

10. උපන් දිනය :

| වර්ෂය: | | | | | මාසය: | | | දිනය: | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

| අවුරුදු: | | | මාස: | | | දින: | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

12. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අ.පො.ස. (සා.පෙළ) විභාගය :

විභාග වර්ෂය :
විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (උ.පෙළ) විභාගය :

විභාග වර්ෂය :
විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14. සේවා පළපුරුද්ද (පූර්ව සේවා කාලය සහ ආයතන පිළිබඳ විස්තර) :

| සේවා කාලය | | පදවි නාමය | සේවා ස්ථානය |
|---|---|---|---|
| සිට | දක්වා | | |
| I. ................. | ................. | ...................................... | ................................................ |
| II. ................. | ................. | ...................................... | ................................................ |
| III. ................. | ................. | ...................................... | ................................................ |

15. වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න.) ඔව් නම් විස්තර සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

..........................................................................................................................................................

17. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

.........................................................................
දිනය : ............................................ අත්සන

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ................................. මස .....................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ........................................................................................
තනතුර : ........................................................................................
ලිපිනය : ........................................................................................
(නිල මුද්‍රාව)

දිනය : ....................................

***සටහන :*** අයදුම්පත සහතික කළයුත්තේ ගැසට් නිවේදනයේ 07 ඡේදයේ (ඉ) වගන්තියේ සඳහන් පරිදිය.

19. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................... නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියතු අයකු වන අතර ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

..................................................... නිල මුද්‍රාව :
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .......................................
ආයතන ප්‍රධානියාගේ නම : ...........................................................................
තනතුර : ...........................................................................
සේවා ස්ථානයේ ලිපිනය : ...........................................................................

02 - 456/2

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීම - 2026

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශ්‍රේණියේ අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුරේ පවතින පුරප්පාඩු සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා වේ. අයදුම්පත් කැඳවන අවසාන දිනය **2026.03.27 දින වේ.**

02. *සේවා කොන්දේසි :*

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, 2014.02.21 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු අරක්කැමි තනතුර සඳහා පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද, අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ ( PL 2) අරක්කැමි III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි I කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඈ) තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත්වන අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

(ඉ) තනතුරට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| අරක්කැමි | III | 01 | 1. ජාත්‍යන්තර මට්ටමේ සහ ජාතික මට්ටමේ ක්‍රීඩා තරගාවලි ඉලක්ක කරගෙන දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන පුහුණු සංචිතයන්හි නේවාසිකව සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අනුමත කෑම වට්ටෝරු අනුව පිරිසිදුව හා සෞඛ්‍ය ආරක්ෂිතව පෝෂ්‍යදායී ආහාර පිළියෙල කිරීම.<br><br>2. දිවයිනේ විවිධ ස්ථානවල වාර්ෂිකව පැවැත්වෙන ජාතික මහා ක්‍රීඩා උළෙල හා එවැනි අනෙකුත් ක්‍රීඩා උළෙලවල දී එක් එක් ඉසව් සඳහා සහභාගීවන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට හා නිලධාරීන්ට නියම කර ඇති කෑම වට්ටෝරු අනුව පිරිසිදුව හා සෞඛ්‍ය ආරක්ෂිතව ආහාර පිළියෙල කිරීම. |

03. *මාසික වැටුප් පරිමාණය:*

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 චක්‍රලේඛයට අනුව, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ (PL 2) අරක්කැමි III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය

**(PL 02 - 2025) රු. 41,800 -10 x 490 – 10 x 540 – 10 x 590 – 12 x 630 – රු. 65,560/=**

(ආරම්භක වැටුප් පියවර - රුපියල් 41,800.00) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

04. *බඳවා ගැනීමේ සුදුසුකම් :*

(අ) *අධ්‍යාපන සුදුසුකම් :*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

(ආ) *වෘත්තීය සුදුසුකම් :*

ආහාර පාන පිළියෙල කිරීම හා පිළිගැන්වීම සම්බන්ධයෙන් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි අවම වශයෙන් දෙවන මට්ටමේ (NVQ-02) නිපුණතාවයක් ලබා ගෙන තිබීම.

(ඇ) *පළපුරුද්ද :*

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. එම පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතු ය.

(ඈ) *කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඈ) *වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් **2026.03.27** දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතු ය.

(ඉ) *වයස :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

යෝග්‍යතාවය ඇගයීමේ වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

(අ) වෘත්තීය පරීක්ෂණය : ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම<br>02. ආහාර පිළියෙල කිරීමේ දී අවශ්‍යවන දැනුම<br>03. විවිධ වර්ගයේ ආහාර පිළියෙල කිරීම සම්බන්ධ දැනුම<br>04. ඉවුම් පිහුම් සඳහා භාවිතා කරන උපකරණ පිළිබඳ දැනුම | 20<br>20<br>40<br>20 | 40% |
| **එකතුව** | **100** | 40% |

(ආ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

i. ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ විෂයය පිළිබඳ දැනුම, අමතර අධ්‍යාපන සුදුසුකම්, අමතර වෘත්තීය සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාව මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියයකි (100).

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| 02. අතිරේක වෘත්තීය සුදුසුකම් | 35 | |
| 03. අතිරේක පළපුරුද්ද | 35 | |
| 04. සම්මුඛ පරීක්ණයේ දී පිළිබිඹු කරන කුසලතාව | 05 | |
| **එකතුව** | **100** | |

ii. වෘත්තීය පරීක්ෂණයෙන් සමත් ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරු බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ. මූලික සුදුසුකම් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ම පරීක්ෂා කරනු ලැබේ.

06. පත්වීම් ලබා දීම : පුරප්පාඩු සංඛ්‍යාව 01 කි.

i. පුරප්පාඩුව සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 (II) අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

ii. වෘත්තීය පරීක්ෂණයේ දී හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර තෝරා ගන්නා අපේක්ෂකයින් අතරින් අයකු යම් කරුණක් හේතුවෙන් පත්වීම භාර නොගැනීම හෝ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වුවහොත්, කුසලතා අනුපිළිවෙළ අනුව අනෙකුත් අපේක්ෂකයින් තෝරා පත් කිරීම ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

07. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා සේවයට බැඳීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් ය.

(ආ) සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් අයදුම්පත් ඉදිරිපත් කරන්නන් අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් තනතුරු නාමය එම භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය.

(ඇ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය 8 ½ " x 12" (ඒ4) කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින් ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. පරිගණකයෙන් සකස් කරන ලද අයදුම්පත් ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 11 තෙක් පළමු පිටුවට ද, අංක 12 සිට 15 තෙක් දෙවන පිටුවටද, ඉතිරිය අනෙක් පිටුවට ද ඇතුළත් වන පරිදි අයදුම්පත සකස් කළ යුතු ය.

(ඈ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.03.27 දිනට** හෝ ඊට පෙර ලැබෙන පරිදි "අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි III ශ්‍රේණියට බඳවා ගැනීම -2026" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. **2026.03.27 දිනට** පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික කරන ලද ඡායා පිටපත් අයදුම් පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) අත්සන සහතික කිරීම - දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙක්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු. 782,808/-ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

(ඊ) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(උ) අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ පිළිබඳව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ දුරකතන අංක 011 2694566 හෝ 011 2697934 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකි ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද තනතුරේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය.

(ඌ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

*සටහන* - අයදුම්කරුවෙකු වෘත්තීය පරීක්ෂණයට කැඳවීම හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පත්වීම ලබාදීම සඳහා සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් වෘත්තිය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වන කාලයේ දී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. වෘත්තිය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ.

09. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

යෝග්‍යතා පරීක්ෂණයේ දී අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(I) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

*හෝ*

(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. වෙනත් කරුණු :

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්. අච්චුදන්,
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

2026 පෙබරවාරි මස 27 දින.
අංක 09,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ අරක්කැමි තනතුර සඳහා බඳවා ගැනීම - 2026

Recruitment to the post of Primary Level - Semi Skilled Service Cook of the Department of Sports Development – 2026

01. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKE)
.............................................................................................................................................
.............................................................................................................................................

02. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(උදා: H.M.S. RATHNAYAKE)
.............................................................................................................................................
.............................................................................................................................................

03. සම්පූර්ණ නම (සිංහලෙන්) :
.............................................................................................................................................
.............................................................................................................................................

04. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.............................................................................................................................................
.............................................................................................................................................

05. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
.............................................................................................................................................
.............................................................................................................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

07. ස්ත්‍රී/පුරුෂභාවය :
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

පුරුෂ - 0
ස්ත්‍රී - 1

| |
|---|
| |

08. ජංගම දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

09. විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය : ………………………………………………………………………………......

10. උපන් දිනය :

වර්ෂය:

| | | | |
|---|---|---|---|
| | | | |

මාසය:

| | |
|---|---|
| | |

දිනය:

| | |
|---|---|
| | |

11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු:

| | | | |
|---|---|---|---|
| | | | |

මාස:

| | |
|---|---|
| | |

දින:

| | |
|---|---|
| | |

12. අධ්‍යාපන සුදුසුකම් :

(අ) අ.පො.ස. (සා.පෙළ) - පළමුවර

විභාග වර්ෂය :

විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (සා.පෙළ) - දෙවන වර

විභාග වර්ෂය :

විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14. සේවා පළපුරුද්ද (පූර්ව සේවා කාලය සහ ආයතන පිළිබඳ විස්තර) :

| | සේවා කාලය සිට | දක්වා | පදවි නාමය | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| I. | ................ | ................ | ..................................... | ............................................... |
| II. | ................ | ................ | ..................................... | ............................................... |
| III. | ................ | ................ | ..................................... | ............................................... |

15. වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න.) ඔව් නම් විස්තර සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

..........................................................................................................................................................

17. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීති වලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..................................................................
දිනය : ........................................... අත්සන

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................................................................................... නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ................................. මස .....................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ..........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ..........................................................................................
තනතුර : ..........................................................................................
ලිපිනය : ..........................................................................................
(නිල මුද්‍රාව)

දිනය : ....................................

***සටහන :*** අයදුම්පත සහතික කළයුත්තේ *ගැසට්* නිවේදනයේ 07 ඡේදයේ (ඉ) වගන්තියේ සඳහන් පරිදිය.

19. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................... නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියතු අයකු වන අතර ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

..................................................... නිල මුද්‍රාව :
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය : .......................................

ආයතන ප්‍රධානියාගේ නම : ...........................................................................
තනතුර : ...........................................................................
සේවා ස්ථානයේ ලිපිනය : ...........................................................................

02 - 456/3

## ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

### ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහායක තනතුර සඳහා බඳවා ගැනීම - 2026

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහායක තනතුරේ පවතින පුරප්පාඩු සඳහා මෙහි පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පිරිමි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම බඳවා ගැනීම සිදු කරනු ලබන්නේ ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය - නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහායක තනතුර සඳහා වේ. අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026.03.27 දින වේ.

02. සේවා කොන්දේසි :

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, 2018.06.26 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම පරිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ක්‍රීඩා භූමි සහායක තනතුර සඳහා පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද, අනාගතයේ දී බඳවා ගනු ලබන නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(ඇ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. ප්‍රාථමික ශිල්පීය - නොවන සේවා ගණයේ (PL 1) ක්‍රීඩා භූමි සහායක III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඈ) තමා වෙත පිරිනමන ලද තනතුරෙහි රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ පත්වීම් අහෝසි කරනු ලැබීමට ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයාට බලය ඇත.

(ඉ) තනතුරට පැවරෙන කාර්යයන් :

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| ක්‍රීඩා භූමි සහායක | III | 08 | 1. ක්‍රීඩා භූමි භාරව සිටින අධීක්ෂණ නිලධාරියා විසින් නියම කරනු ලබන දෛනික රාජකාරි කටයුතු ඉටු කිරීම.<br><br>2. ක්‍රීඩා පිටි සළකුණු කිරීම සහ එම සළකුණු දිගු කලක් පැහැදිලිව පවතින ආකාරයෙන් පවත්වාගෙන යාම.<br><br>3. ක්‍රීඩා පිටි සළකුණු කිරීමට අවශ්‍ය වන තීන්ත වර්ග, තෙල්, තණකොළ කපන යන්ත්‍ර සඳහා යොදන ඉන්ධන හා ක්‍රීඩා පිටි යථා තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට අවශ්‍ය අනෙකුත් අවශ්‍යතා සොයා බලා අධීක්ෂණ නිලධාරියාට වාර්තා කිරීම. |

| *අනුමත තනතුරු නාමය* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *කාර්යයන්* |
|---|---|---|---|
| | | | 4. ක්‍රීඩා පිටියේ නඩත්තුව සඳහා අවශ්‍ය උපකරණ (තණකොළ කපන යන්ත්‍ර වැනි උපකරණ) නියමිත පරිදි ලබා ගැනීම හා නිසි පරිදි අධීක්ෂණ නිලධාරියාට ආපසු භාර දීම.<br><br>5. ක්‍රීඩා පිටියේ තණකොළ කැපීමට භාවිතා කරන යන්ත්‍ර සූත්‍ර ආදිය ක්‍රියා කරවීමට හැකි වීම.<br><br>6. එකී යන්ත්‍ර යොදා ක්‍රීඩා පිටියේ තණකොළ කපා පිටිය අවට ප්‍රදේශය අධීක්ෂණ නිලධාරියාගේ උපදෙස් මත ශුද්ධ කර පවත්වාගෙන යාම.<br><br>7. එම යන්ත්‍ර සූත්‍ර අධීක්ෂණ නිලධාරියාගේ උපදෙස් මත නඩත්තු කිරීම, පවත්වාගෙන යාම හා අලුත්වැඩියා කිරීම.<br><br>8. ක්‍රීඩා පිටිවල ජල සැපයුම් කටයුතු නිසි පරිදි සිදු කිරීම හා නිසි පරිදි පවත්වාගෙන යාම. |

**03. මාසික වැටුප් පරිමාණය:**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 චක්‍රලේඛය අනුව, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය - නොවන සේවා ගණයේ (PL 01) ක්‍රීඩා භූමි සහායක III ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය

**(PL 01 - 2025) රු. 40,000 -10 x 450 – 10 x 490 – 10 x 540 – 12 x 590 – රු. 61,880/=**

(ආරම්භක වැටුප් පියවර - රුපියල් 40,000.00) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

**04. බඳවා ගැනීමේ සුදුසුකම් :**

(*අ*) අධ්‍යාපන සුදුසුකම් :

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත් වී තිබීම.

(*ආ*) වෘත්තීය සුදුසුකම් :

අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(*ඇ*) පළපුරුද්ද :

අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(*ඈ*) කායික සුදුසුකම් :

සැම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

(ඉ) වෙනත් සුදුසුකම් :

I. ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026.03.27 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතු ය.

(ඊ) වයස :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය: ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ම මූලික සුදුසුකම් පරීක්ෂා කෙරේ.

(අ) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

i. ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ විෂයය පිළිබඳ දැනුම, අමතර අධ්‍යාපන සුදුසුකම්, අමතර වෘත්තීය සුදුසුකම් සහ සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාව මැන බැලීම සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහි දී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 100 කි.

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් | 25 | අදාළ නොවේ |
| 02. පළපුරුද්ද | 35 | |
| 03. වෘත්තීය සුදුසුකම් | 35 | |
| 04.සම්මුඛ පරීක්ෂණයේ දී පිළිබිඹු කරන කුසලතාව | 05 | |
| **එකතුව** | **100** | |

**06. පත්වීම් ලබා දීම :**

පුරප්පාඩු සංඛ්‍යාව 08 කි.

(i.) පුරප්පාඩු සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු පිරවීම පිළිබඳ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 (II) අනුව තීරණය කරනු ලැබේ. පත්වීම ක්‍රියාත්මකවන දිනය ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

(ii.) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහායක III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර තෝරා ගන්නා අපේක්ෂකයින් අතරින් අයකු යම් කරුණක් හේතුවෙන් පත්වීම භාර නොගැනීම හෝ සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් පුරප්පාඩු ඇති වුවහොත්, කුසලතා අනුපිළිවෙළ අනුව අනෙකුත් අපේක්ෂකයින් තෝරා පත් කිරීම ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

07. අයදුම් කිරීමේ ක්‍රමය :

(අ) ඉල්ලුම්පත් සකස් කළ යුත්තේ තමා සේවයට බැඳීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් ය.

(ආ) සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් අයදුම්පත් ඉදිරිපත් කරන්නන් අයදුම්පත්‍රවල ශීර්ෂයේ සඳහන් තනතුරු නාමය එම භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතු ය.

(ඇ) අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය 8 ½ " x 12" (ඒ4) කඩදාසියක සකස් කර අපේක්ෂකයා විසින්ම සිය අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය. පරිගණකයෙන් සකස් කරන ලද අයදුම්පත්ද භාවිතා කළ හැකිය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 11 තෙක් පළමු පිටුවටද, අංක 12 සිට 15 තෙක් දෙවන පිටුවටද, ඉතිරිය අනෙක් පිටුවටද ඇතුලත්වන පරිදි අයදුම්පත සකස් කළ යුතු ය.

(ඈ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් **2026.03.27** දිනට හෝ ඊට පෙර ලැබෙන පරිදි "අධ්‍යක්ෂ ජනරාල්, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.

අයදුම්පත බහා ඇති කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික - ශිල්පීය නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහයක III ශ්‍රේණියට බඳවා ගැනීම -2026" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. **2026.03.27** දිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික කරන ලද ඡායා පිටපත් අයදුම් පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතු ය.

(ඉ) *අත්සන සහතික කිරීම* - දැනට රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කරුවෙක්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසිනි. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන්, ඒවා සහතික කිරීමට බලයලත් කෙනෙකු විසින් සහතික කළ යුතුය. එනම් සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයකු, නොතාරිස් කෙනෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයකු, වාර්ෂිකව රු. 782,808/-ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන රජයේ ස්ථිර නිලධාරියකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන කෙනෙකු විය යුතු ය.

(ඊ) අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(උ) අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ පිළිබඳව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ දුරකතන අංක 011 2694566 හෝ 011 2697934 ඔස්සේ සතියේ වැඩ කරන දිනයන්හි **පෙ.ව. 08.30 සිට ප.ව. 4.00 දක්වා විමසිය හැකි ය.** එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද තනතුරේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය.

(ඌ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු/ මණ්ඩල/ සංස්ථා ආදියෙහි දැනට සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ආයතනයේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

*සටහන* - අයදුම්කරුවෙකු වෘත්තීය පරීක්ෂණයට කැඳවීම හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පත්වීම ලබාදීම සඳහා සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

**08. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පවත්වන කාලයේදී හෝ ඉන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට අපේක්ෂකයින් යටත් වේ.

**09. අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(I) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;

*හෝ*

(II) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**10. වෙනත් කරුණු :**

මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව ක්‍රීඩා සංවර්ධන අධ්‍යක්ෂ ජනරාල් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

11. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

එස්. අච්චුදන්,
අධ්‍යක්ෂ ජනරාල්,
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව.

2026 පෙබරවාරි මස 27 දින.
අංක 09,
පිලිප් ගුණවර්ධන මාවත,
කොළඹ 07.

**ආදර්ශ අයදුම්පත**

| |
|---|
| |

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ක්‍රීඩා භූමි සහායක තනතුර සඳහා බඳවා ගැනීම - 2026**

Recruitment to the post of Primary Level - Unskilled Service Ground Level Assistant of the Department of Sports Development – 2026

01. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(*උදා:* HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKE)
.....................................................................................................................................
.....................................................................................................................................

02. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
(*උදා:* H.M.S. RATHNAYAKE)
.....................................................................................................................................
.....................................................................................................................................

03. සම්පූර්ණ නම (සිංහලෙන්) :
.....................................................................................................................................
.....................................................................................................................................

04. ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....................................................................................................................................
.....................................................................................................................................

05. ස්ථිර ලිපිනය (සිංහලෙන්) :
.....................................................................................................................................
.....................................................................................................................................

06. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

07. ස්ත්‍රී/පුරුෂභාවය : පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) ස්ත්‍රී - 1

08. ජංගම දුරකථන අංකය :

09. විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය : ………………………………………………………………………….......

10. උපන් දිනය :
වර්ෂය: මාසය: දිනය:

11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු: මාස: දින:

12. අධ්‍යාපන සුදුසුකම් :
(අ) අ.පො.ස. (සා.පෙළ) පළමු වර — විභාග වර්ෂය :

විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ආ) අ.පො.ස. (සා.පෙළ) දෙවන වර — විභාග වර්ෂය :

විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

13. අතිරේක අධ්‍යාපන සුදුසුකම් :

| *ආයතනය* | *පාඨමාලාවේ නම* | *කාල සීමාව* | *සහතිකය වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

14. සේවා පළපුරුද්ද (පූර්ව සේවා කාලය සහ ආයතන පිළිබඳ විස්තර) :

| *සේවා කාලය* | | *පදවි නාමය* | *සේවා ස්ථානය* |
|---|---|---|---|
| *සිට* | *දක්වා* | | |
| I. ................ | ................ | ..................................... | ............................................... |
| II. ................ | ................ | ..................................... | ............................................... |
| III. ................ | ................ | ..................................... | ............................................... |

15. වෘත්තීය සුදුසුකම් :

| *ආයතනය* | *පාඨමාලාවේ නම* | *කාල සීමාව* | *සහතිකය වලංගු දිනය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

16. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?
(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න.) ඔව් නම් විස්තර සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

...........................................................................................................................................................

17. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි. අසත්‍ය බව මා තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වීමට යටත් බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියකින් තොරව මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මා දැන සිටිමි. තව ද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

..................................................................
අත්සන.

දිනය : ..........................................

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (අදාළ නොවන වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය ................................. මස ....................වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව මෙයින් සහතික කරමි.

සහතික කරන්නාගේ අත්සන : ........................................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම : ........................................................................................
තනතුර : ........................................................................................
ලිපිනය : ........................................................................................
(නිල මුද්‍රාව)

දිනය : ....................................

***සටහන :*** අයදුම්පත සහතික කළයුත්තේ *ගැසට්* නිවේදනයේ 07 ඡේදයේ (ඉ) වගන්තියේ සඳහන් පරිදි ය.

19. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................ නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයකු වන අතර ඔහු/ ඇය ඉහත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/ නොහැකිය.

..................................................... නිල මුද්‍රාව :
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : .......................................
ආයතන ප්‍රධානියාගේ නම : .........................................................................
තනතුර : .........................................................................
සේවා ස්ථානයේ ලිපිනය : .........................................................................

02 - 456/4

---

## ආරක්ෂක අමාත්‍යාංශය

### ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ කළමනාකාර ගණයට අයත් සහකාර අධ්‍යක්ෂ තනතුරු (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ කළමනාකාර ගණයට අයත් සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා ස්ථිර පදනම මත පුරප්පාඩු 02ක් පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය:**

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීම් හෝ පුවත්පත් දැන්වීම් මගින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධරයා විසින් පත්කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

i. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් බඳවා ගැනීම් මෙන්ම සේවා ගණය තුළ උසස් කිරීම් ද මෙම පටිපාටියෙහි විධිවිධානයට තරයේ අනුකූල වන පරිදි පමණක් සිදු කළ යුතු ය.

ii. බඳවා ගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට ආනුෂාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

iii. මෙම බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් මෙහි දැක්වෙන විධි විධාන ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක විය යුතු ය.

පත්වීම් බලධරයා වනුයේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවයි.

**02. අවශ්‍ය සුදුසුකම් :**

i. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :

- බාහිර අයදුම්කරුවන්
  රසායන විද්‍යාව විශේෂවේදී හෝ ඉංජිනේරු (රසායනික) යන විෂයය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම;

  *සහ*

  සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් රසායනික සුරක්ෂිතතාවය, හදිසි අවස්ථා කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි වසරක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන්
  ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

ii. කායික සුදුසුකම්:

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය

කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. වෙනත් සුදුසුකම් :

(අ) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.
(ආ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය,

II. බාහිර අයදුම්කරුවන් අතුරින් තනතුරට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ තනතුරේ ස්ථිර කරනු ලැබේ. සුදුසුකම් ලැබීමේ සේවා ගණයේ තනතුරක ස්ථිර කර සිටින අභ්‍යන්තර අයදුම්කරුවන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් සේවයට පත් කිරීමේ දී වැඩ බැලීමේ පරීක්ෂණ කාල සීමාවක් නියම කරනු ලැබිය හැකිය.

III. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

**04. වයස් සීමාව :**

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු : 22ට නොඅඩු හා අවු : 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**05. වැටුප් පරිමාණය :**
MM 1-1 2025 - රු. 91,690 – 10 X 2,480 – 15 X 3,450 – රු. 168,240
(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උපලේඛනය පරිදි වේ.)

**06. යෝග්‍යතා ඇගයීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත පරිදි වේ.**

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන සුදුසුකම් | ලකුණු 30 |
| 03. | අනෙකුත් කුසලතා / කාර්යසාධනය | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | ලකුණු 25 |
| | මුළු ලකුණු ගණන | 100 |

*සටහන* - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍ර වලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. වලංගු ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**08. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක සේවා අංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටෙ යන ලිපිනය වෙත **2026.03.27** දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් 02 වන පිටුව අංක 04 සිට 06 දක්වාත් 03 වන පිටුව අංක 07 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

iii. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ **සහකාර** අධ්‍යක්ෂ තනතුර (ස්ථිර) - සහකාර අධ්‍යක්ෂ (ක්‍රියාත්මක කිරීම් සහ බලපත්‍ර) / සහකාර අධ්‍යක්ෂ (පුහුණු, හදිසි අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන) සඳහා අයදුම් කිරීම"යනුවෙන් සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු හෝ රු. 72,280/- ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

vi. මේ සමග ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09.** **සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

**11.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධාරයා වන ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවේ නියමය පරිදි,

ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය.

2026 පෙබරවාරි මස 20 දින ,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,

**ආදර්ශ අයදුම්පත්‍රය**

**ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ කළමනාකාර ගණයට අයත් සහකාර අධ්‍යක්ෂ තනතුරු (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම.**

| | |
|---|---|
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න (සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි -4)
සටහන :- අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

01. 1.1 මුලකුරු සමඟ නම :- Mr./ Mrs. / Miss : ………………………………………………………………..
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම : ………………………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

කෝට්ටේ1.3 සම්පූර්ණ නම : ……………………………………………………………………………………
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ……………………………………………………………………

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : …………………………………………………………………

2.3 දුරකතන අංකය :

ස්ථාවර : …………………………………… ජංගම : …………………………….

03. 3.1 ජනවර්ගය : [ ] සිංහල -1 දෙමළ - 2 මුස්ලිම් - 3 වෙනත් - 4

3.2 ස්ත්‍රී / පුරුෂ භාවය : [ ] පුරුෂ -1 ස්ත්‍රී - 2
(අදාළ කොටුව තුළ ලියන්න)

3.3 විවාහක / අවිවාහක බව : [ ] විවාහක - 1 / අවිවාහක - 2
(අදාළ කොටුව තුළ ලියන්න)

3.4 උපන් දිනය : වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

3.5 2025.10.31 දිනට වයස : අවුරුදු: [ ][ ][ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

3.6 ජාතික හැඳුනුම්පත් අංකය: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.0 අධ්‍යාපන සුදුසුකම්

4.1.1. උපාධිය
( i ) උපාධිය බලපැවැත්වෙන දිනය : …………………………………………….
( ii ) විශ්වවිද්‍යාලය / ආයතනය : …………………………………………….
(iii ) උපාධිය : …………………………………………….

4.2. තනතුරට අදාළ පළපුරුද්ද : ……………………………………………

4.3 අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්

(i) ආයතනය : ………………………………………….
(ii) සුදුසුකම : ………………………………………….
(iii) සුදුසුකම් බලාත්මක වන දිනය : ……………………………………………

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? නැත [ ] ඔව් [ ]
(අදාළ කොටුවේ ලකුණ ( √ ) යොදන්න) ( ඔව් නම් විස්තර කරන්න)
……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………

06. අයදුම්කරුගේ සහතිකය :
මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

………………… ………………………………………
දිනය අයදුම්කරුගේ අත්සන.

07. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු හෝ රු. 72,280 /- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී.................................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

..................... ..............................................................,
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම : ...............................................
තනතුර : ...............................................
දිනය : ................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:

ඉහත විස්තර සඳහන් ............................................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

..............................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

02 - 504/1

---

**ආරක්ෂක අමාත්‍යාංශය**

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාපෘති නිලධාරි සේවා ගණයට අයත් රසායන ද්‍රව්‍ය පරීක්ෂක තනතුරු (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාපෘති නිලධාරි සේවා ගණයට අයත් රසායන ද්‍රව්‍ය පරීක්ෂක තනතුරු සඳහා ස්ථිර පදනම මත පුරප්පාඩු 05 ක් පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය:

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීම් හෝ පුවත්පත් දැන්වීම් මඟින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගනු ලැබේ.

i. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් බඳවා ගැනීම් මෙන්ම සේවා ගණය තුළ උසස්

කිරීම් ද මෙම පටිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන පරිදි පමණක් සිදු කළ යුතු ය.

ii. බඳවා ගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට ආනුෂාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

iii. මෙම බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් මෙහි දැක්වෙන විධි විධාන ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක විය යුතු ය.

පත්වීම් බලධාරයා වනුයේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවයි.

**02. අවශ්‍ය සුදුසුකම් :**

***i. අධ්‍යාපන සුදුසුකම්:***

- *බාහිර අයදුම්කරුවන් :*

  රසායන විද්‍යාව හෝ ඉංජිනේරු (රසායනික) යන විෂයය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සහ අදාළ විෂයය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකමක් ලබා තිබීම.

- *අභ්‍යන්තර අයදුම්කරුවන් :*

  ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

***ii. කායික සුදුසුකම්:***

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

***iii. වෙනත් සුදුසුකම් :***

(*අ*) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(*ආ*) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය.

ii. බාහිර අයදුම්කරුවන් අතුරින් තනතුරේ II ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ තනතුරේ ස්ථිර කරනු ලැබේ. පත්වීම් ලබන විට ද ආයතනයේ ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින තැනැත්තන් එක් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

**04. වයස් සීමාව :**

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු : 22ට නොඅඩු හා අවු : 45ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**05. වැටුප් පරිමාණය :**

MA 5-2 2025 - රු 62,310 – 10 X 1,360 – 15 X 2,040 – රු. 111,160
(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උපලේඛණය පරිදි වේ.)

06. යෝග්‍යතා ඇගයීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන/ වෘත්තිය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | අනෙකුත් කුසලතා / කාර්යසාධනය | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාව | ලකුණු 25 |
| | මුළු ලකුණු ගණන | 100 |

***සටහන.-*** යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍ර වලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

- යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
- සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.
- සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

  (i.) වලංගු ජාතික හැඳුනුම්පත,
  (ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**08. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

(i.) සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක සේවා අංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනය වෙත 2026.03.27 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii.) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත්, 02 වන පිටුව අංක 04 සිට 06 දක්වාත්, 03 වන පිටුව අංක 07 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii.) අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ "රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ රසායන ද්‍රව්‍ය පරීක්ෂක තනතුර (ස්ථිර)" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv.) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 72,280ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

(v.) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයදුම්පත් තමන් සේවය කරන ආයතනයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

(vi.) මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධරයා වන ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවේ නියමය පරිදි,

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2026 පෙබරවාරි මස 20 දින,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

## ආදර්ශ අයදුම්පත්‍රය

### ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාපෘති නිලධාරි සේවා ගණයට අයත් රසායන ද්‍රව්‍ය පරීක්ෂක තනතුරු (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

| | |
|---|---|
| | |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |
|---|---|

(අදාළ අංකය කොටුව තුළ ලියන්න (සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි -4)
*සටහන* :- අයදුම් කරන භාෂා මාධ්‍ය වෙනස් කළ නොහැක.

---

01. 1.1 මුලකුරු සමඟ නම :- Mr./ Mrs. / Miss : …………………………………………………………..…………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම : …………………………………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම : …………………………………………………………………………………………………
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ……………………………………………………………………..…

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ………………………………………………………………...……

2.3 දුරකතන අංකය :

ස්ථාවර : ……………………………………… ජංගම : …………………………….

03. 3.1 ජන වර්ගය : ☐ සිංහල -1 දෙමළ - 2 මුස්ලිම් - 3 වෙනත් - 4

3.2 ස්ත්‍රී / පුරුෂ භාවය : ☐ පුරුෂ -1 ස්ත්‍රී - 2
(අදාළ කොටුව තුළ ලියන්න)

3.3 විවාහක / අවිවාහක බව : ☐ විවාහක - 1
(අදාළ කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

3.4 උපන් දිනය : වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

3.5 2025.12.31 දිනට වයස : අවුරුදු: ☐☐☐☐ මාස: ☐☐ දින: ☐☐

3.6 ජාතික හැඳුනුම්පත් අංකය: ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1.1. ප්‍රථම උපාධිය :-
( i ) උපාධිය බලපැවැත්වෙන දිනය : ………………………………………………….

( ii ) විශ්වවිද්‍යාලය / ආයතනය : ……………………………………………….
(iii ) උපාධිය : …………………………………………………

4.1.2. පශ්චාත් උපාධිය :-
( i ) උපාධිය බලපැවැත්වෙන දිනය : ……………………………………………….
( ii ) විශ්වවිද්‍යාලය / ආයතනය : ……………………………………………….
(iii ) උපාධිය : …………………………………………………

4.2. තනතුරට අදාළ පළපුරුද්ද : ……………………………………………….

4.3 අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්
(i) ආයතනය : ……………………………………………….
(ii) සුදුසුකම : ……………………………………………….
(iii) සුදුසුකම් බලාත්මක වන දිනය : …………………………………………………

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? (අදාළ කොටුවේ ලකුණ ( √ ) යොදන්න) ( ඔව් නම් විස්තර කරන්න)

| නැත | | ඔව් | |
|---|---|---|---|

..............................................................................................................................................................................
..............................................................................................................................................................................

06. අයදුම්කරුගේ සහතිකය :
මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

..................... ..............................................
දිනය අයදුම්කරුගේ අත්සන.

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 72,280 /- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී.................................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

..................... ..............................................................,
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම : ..............................................
තනතුර : ..............................................
දිනය : ...............................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:

ඉහත විස්තර සඳහන් ............................................................. මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

...........................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

02 - 504/2

www.defence.lk වෙබ් අඩවියෙහි ඇති වැඩිදුර තොරතුරු

**ආරක්ෂක අමාත්‍යාංශය**

තනතුරු පුරප්පාඩු

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන තනතුරු (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන තනතුරු සඳහා ස්ථිර පදනම මත පුරප්පාඩු 02ක් පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය:**

රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි පුවත්පත් දැන්වීමකින් හෝ ප්‍රසිද්ධ දැන්වීමකින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

(i.) මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම්/ බඳවා ගැනීම් මෙන්ම සේවා ගණය තුළ උසස් කිරීම් ද මෙම පටිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන පරිදි පමණක් සිදු කළ යුතු ය.

(ii.) බඳවා ගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට ආනුෂාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

(iii.) මෙම බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් මෙහි දැක්වෙන විධිවිධාන ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක විය යුතු ය.

පත්වීම් බලධාරයා වනුයේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවයි.

**02. අවශ්‍ය සුදුසුකම් :**

(i.) අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:

- බාහිර අයදුම්කරුවන් :

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල/දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

- අභ්‍යන්තර අයදුම්කරුවන් :

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය, සහ ශිල්පීය සේවා ගණයන්හි පහත “ ආ ", “ ඇ ", "ඉ" සඳහන් සුදුසුකම් ඇති සේවකයන්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි භාෂාව යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත්ව තිබීම.

(ඇ) සේවයේ ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතු ය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්න ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

***සටහන .-*** (1) යම් තනතුරකට ස්ථිරව පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇත්තා වූ හෝ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇත්තා වූ පුහුණුවීමේ කාල පරිච්ඡේදයක් ඉහත "ඉ" ඡේදයේ සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ. යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික / අනියම් සේවා කාල පරිච්ඡේද ඉහත "ඉ" ඡේදයේ සඳහන් සුදුසුකම් ලැබීමේ පස් අවුරුදු කාල සීමාව සඳහා ගණන් ගනු නොලැබේ.

(ii.) කායික සුදුසුකම්:

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය

කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. වෙනත් සුදුසුකම් :

(අ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(ආ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

i. මෙම තනතුර ස්ථිර ය

ii. බාහිර අයදුම්කරුවන් අතුරින් තනතුරේ II ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරියකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වා ගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ තනතුරේ ස්ථිර කරනු ලැබේ. පත්වීම් ලබන විට ද ආයතනයේ ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින තැනැත්තන් එක් වසරක වැඩ බැලීමේ කාල සීමාවකට යටත් කරනු ලැබේ.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව :*

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු : 18ට නොඅඩු හා අවු : 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

05. *වැටුප් පරිමාණය :*

MA 1-1 2025 - රු. 46,220 - 10x540 - 7x 630 - 4 x 890 – 20 x 1,190 - 83,390

(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උපලේඛනය පරිදි වේ.)

06. යෝග්‍යතා ඇගයීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 30 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් | ලකුණු 30 |
| 03. | අනෙකුත් කුසලතා / කාර්ය සාධනය | ලකුණු 15 |
| 04. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | ලකුණු 25 |
| | මුළු ලකුණු ගණන | 100 |

*සටහන.-* යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍ර වලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

07. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. වලංගු ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

08. *අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය*

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක සේවා අංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනය වෙත 2026.03.27 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් 02 වන පිටුව අංක 04 සිට 06 දක්වාත් 03 වන පිටුව අංක 07 සිට 08 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

iii. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ “රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන”තනතුර (ස්ථිර) යනුවෙන් සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතීඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 72,280/- ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

vi. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධාරයා වන ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවේ නියමය පරිදි,

2026 පෙබරවාරි මස 20 දින,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

## ආදර්ශ අයදුම්පත්‍රය

**ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයට අයත් කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන තනතුරු (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම**

| | |
|---|---|
| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න (සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි -4)
**සටහන** :- අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

01. 1.1 මුලකුරු සමඟ නම :- Mr./ Mrs. / Miss : ……………………………………………………………..…………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම : ……………………………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම : ……………………………………………………………………………………………
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ……………………………………………………………………………..…

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : ……………………………………………………………………...……

2.3 දුරකථන අංකය :

ස්ථාවර : ……………………………………… ජංගම : …………………………….

03. 3.1 ජනවර්ගය : [ ] සිංහල -1 දෙමළ - 2 මුස්ලිම් - 3 වෙනත් - 4

3.2 ස්ත්‍රී / පුරුෂ භාවය : [ ] පුරුෂ -1 ස්ත්‍රී - 2
(අදාළ කොටුව තුළ ලියන්න)

3.3 විවාහක / අවිවාහක බව : [ ] විවාහක - 1
(අදාළ කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

3.4 උපන් දිනය : වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

3.5 2025.12.31 දිනට වයස : අවුරුදු: [ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

3.6 ජාතික හැඳුනුම්පත් අංකය: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.0 අධ්‍යාපන සුදුසුකම් (සහතිකවල පිටපත් ඇමිණිය යුතු ය.)

4.1.1. අ.පො.ස. (සා.පෙළ) විභාගය :

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | වර්ෂය | අනු. අංකය | විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

4.1.2. අ.පො.ස. (උ.පෙළ) විභාගය :

| අනු. අංකය | විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.2. තනතුරට අදාළ පළපුරුද්ද : ......................................................

4.3 අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :

(i) ආයතනය : ......................................................................................................................
(ii) සුදුසුකම : ......................................................................................................................
(iii) සුදුසුකම් බලාත්මක වන දිනය : ......................................................................................

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? (අදාළ කොටුවේ ලකුණ ( √ ) යොදන්න) ( ඔව් නම් විස්තර කරන්න)

| නැත | | ඔව් | |
|---|---|---|---|

.......................................................................................................................................................
.......................................................................................................................................................

06. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීතිවලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

...................... ..............................................
දිනය අයදුම්කරුගේ අත්සන.

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරි ලත් නිලධාරියෙකු හෝ රු. 72,280 /- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .......................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු/ඇය මා ඉදිරිපිට දී................................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

..................... ................................................................,
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම : ..............................................
තනතුර : ..............................................
දිනය : ..............................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:

ඉහත විස්තර සඳහන් ............................................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.............................................................,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව යොදන්න)

02 - 504/3

## ආරක්ෂක අමාත්‍යාංශය

### ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් කාර්යාල කාර්ය සහයක තනතුර (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් කාර්යාල කාර්ය සහයක තනතුර සඳහා ස්ථිර පදනම මත පුරප්පාඩු 01ක් පිරවීම සඳහා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. බඳවා ගැනීමේ ක්‍රමය:**

රජයේ *ගැසට්* පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් ඉල්ලුම්පත් කැඳවා පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමෙන් පසු III ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

i. මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම්/ බඳවා ගැනීම් මෙන්ම සේවා ගණය තුළ උසස් කිරීම් ද මෙම පටිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන පරිදි පමණක් සිදු කළ යුතු ය.

ii. බඳවා ගැනීමෙන් පසු සේවයේ යෙදවීම හා ඊට ආනුෂාංගික අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

iii. මෙම බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් සියලු කරුණු සම්බන්ධයෙන් මෙහි දැක්වෙන විධිවිධාන ආයතනික කාර්ය පටිපාටි සංග්‍රහයේ විධිවිධාන අභිබවා ක්‍රියාත්මක විය යුතු ය.

පත්වීම් බලධාරයා වනුයේ ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවයි.

**02. අවශ්‍ය සුදුසුකම් :**

i. සුදුසුකම්

- **බාහිර අයදුම්කරුවන් :**
  අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටීම.

ii. කායික සුදුසුකම්:

තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

iii. වෙනත් සුදුසුකම් :

(අ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(ආ) අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිර ය.

ii. සේවයේ/ තනතුරේ III ශ්‍රේණියට පත් කරනු ලබන සේවකයකු වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ.

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

**04. වයස් සීමාව :**

ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවු : 18ට නොඅඩු හා අවු : 45ට නොවැඩි විය යුතු ය.

**05. වැටුප් පරිමාණය :**

PL 1 2025 - රු. 40,500 - 10x 450 – 10 x 490 - 7 x 540 – 15 x 590 – රු. 62,530

(ඔබට වැටුප් ගෙවනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි II උපලේඛනය පරිදි වේ.)

**06. යෝග්‍යතා ඇගයීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීම පහත පරිදි වේ:**

| | | |
|---|---|---|
| 01. | අදාළ පළපුරුද්ද | ලකුණු 20 |
| 02. | අදාළ අතිරේක අධ්‍යාපනික සුදුසුකම් | ලකුණු 20 |
| 03. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව | ලකුණු 60 |
| | මුළු ලකුණු ගණන | 100 |

*සටහන* - යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතික පත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම්, එවැනි සහතිකපත්‍ර වලට අදාළ කාලසීමාවන් අදාළ ආයතනය මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාල සීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලැබේ.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.
සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්වල මුල්පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.
සම්මුඛ පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ:

i. වලංගු ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**08. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක සේවා අංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ යන ලිපිනය වෙත 2026.03.27 දිනට හෝ එදිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් 02 වන පිටුව අංක 04 සිට 07 දක්වාත් ඇතුළත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

iii. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ **කාර්යාල කාර්ය සහයක තනතුර**" තනතුර (ස්ථිර) යනුවෙන් සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු /ප්‍රසිද්ධ නොතාරිස්වරයකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු හෝ රු. 72,280/- ක මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කළ යුතු ය.

v. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**09. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10.** මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

**11.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව පත්වීම් බලධාරයා වන ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

ජාතික අධිකාරියේ මෙහෙයුම් කමිටුවේ නියමය පරිදි,

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2026 පෙබරවාරි මස 20 දින,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

## ආදර්ශ අයදුම්පත්‍රය

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයට අයත් කාර්යාල කාර්ය සහයක තනතුර (ස්ථිර) සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම

| සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින භාෂා මාධ්‍යය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

(අදාළ අංකය කොටුව තුල ලියන්න (සිංහල-2/දෙමළ-3/ඉංග්‍රීසි -4)
සටහන :- අයදුම් කරන භාෂා මාධ්‍යය වෙනස් කළ නොහැක.

---

01. 1.1 මුලකුරු සමඟ නම :- Mr./ Mrs. / Miss : ……………………………………………………………..…………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.2 සම්පූර්ණ නම : ………………………………………………………………………………………………
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

1.3 සම්පූර්ණ නම : ………………………………………………………………………………………………
(සිංහලෙන්/දෙමළෙන්)

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ………………………………………………………………….…

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : …………………………………………………………...……

2.3 දුරකතන අංකය :

ස්ථාවර : ……………………………………… ජංගම : …………………………….

03. 3.1 ජනවර්ගය : [ ] සිංහල -1 දෙමළ - 2 මුස්ලිම් - 3 වෙනත් - 4

3.2 ස්ත්‍රී / පුරුෂ භාවය : [ ] පුරුෂ -1 ස්ත්‍රී - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.3 විවාහක / අවිවාහක බව : [ ] විවාහක - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) අවිවාහක - 2

3.4 උපන් දිනය : වර්ෂය: [ ][ ][ ][ ] මාසය: [ ][ ] දිනය: [ ][ ]

3.5 2025.12.31 දිනට වයස : අවුරුදු: [ ][ ] මාස: [ ][ ] දින: [ ][ ]

3.6 ජාතික හැඳුනුම්පත් අංකය: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1. අ.පො.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටි වර්ෂය : ..........................................
(විභාගය සඳහා පෙනී සිටි බවට තහවුරු කිරීමට සහතිකයේ පිටපත ඇමිණිය යුතු ය.)

4.2. තනතුරට අදාළ පළපුරුද්ද : .......................................................

4.3 අතිරේක අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :

(i) ආයතනය : .......................................................
(ii) සුදුසුකම : .......................................................
(iii) සුදුසුකම් බලාත්මක වන දිනය : .............................................................

05. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ?
(අදාළ කොටුවේ ලකුණ ( √ ) යොදන්න) ( ඔව් නම් විස්තර කරන්න)

| නැත | | ඔව් | |
|---|---|---|---|

..............................................................................................................................................................................................................
..............................................................................................................................................................................................................

06. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

...................... ................................................
දිනය අයදුම්කරුගේ අත්සන.

07. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතීඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු. 72,280 /- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් හෝ සහතික කළ යුතු ය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී.................................................. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, සහතික කරමි.

..................... ..............................................................,
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම : ...............................................
තනතුර : ...............................................
දිනය : ................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

02 - 504/4

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය**

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ මෝටර් වාහන පරීක්ෂක III ශ්‍රේණිය (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025(2026)

ශ්‍රී ලංකා තාක්ෂණ සේවය යටතේ පවතින, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ මෝටර් වාහන පරීක්ෂක තනතුරුවල පවත්නා පුරප්පාඩුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම බඳවා ගැනීම තරග විභාගයේ ප්‍රතිඵල මත සිදුකරනු ලබන අතර, එම තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් **2026 ජූනි මස කොළඹ** දී පවත්වනු ඇත.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications-Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාරගැනීම **2026 මාර්තු මස 03 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 මාර්තු මස 27 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.**

දැනට රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මෝටර් වාහන පරීක්ෂක තනතුරෙහි පවත්නා පුරප්පාඩු 25ක් සම්පූර්ණ කිරීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ. මෝටර් වාහන පරීක්ෂක තනතුර, මෝටර් රථ වාහන ආඥාපනත (203 වන අධිකාරිය) යටතේ නියම කරන ලද කටයුතු හා සමගාමීව රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය ප්‍රවීණත්වය පරීක්ෂා කිරීම, වාහන ලියාපදිංචි කිරීමේ දී මෝටර් රථ වාහන ආඥාපනතට අනුකූලදැයි පරීක්ෂා කර වාර්තා කිරීම, රියදුරන් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලවලට ද වාහන මිල දී ගැනීමේ හා අපහරණය කිරීමේ මණ්ඩලවලට ද සහභාගි වීම, ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා වාහන පරීක්ෂා කර වාර්තා කිරීම, හදිසි අනතුරු වාහන පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම, යෝග්‍යතා සහතික නිකුත් කිරීම, ගරාජ පරීක්ෂා කර අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, රියදුරු පාසල් පරීක්ෂා කර අවශ්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, ධාවනයට නුසුදුසු වාහන සඳහා තහනම් නියෝග ඉදිරිපත් කිරීම සහ අධිකරණය හා වෙනත් අදාළ ආයතන වෙත රථ වාහන සම්බන්ධ විශේෂඥ වාර්තා ඉදිරිපත් කිරීම යනාදී රාජකාරිවලින් සමන්විත තනතුරකි.

**01. සේවා කොන්දේසි :**

රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව සකස් කර, අංක : PSC/EST/04-01-43/02/2018 හා 2018.06.14 දිනැති ලිපිය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයේ මෝටර් වාහන පරීක්ෂක තනතුර සඳහා වන බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියෙහි සඳහන් කොන්දේසිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් මෝටර් වාහන පරීක්ෂක (ශ්‍රී ලංකා තාක්ෂණ සේවය) III ශ්‍රේණියට පත්කරනු ලැබේ. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය.

**02. වැටුප් කාණ්ඩය හා පරිමාණය :**

වැටුප් කේත අංකය : MN 3 – 2025
වැටුප් පරිමාණය : රු. **52,250/- 10x800/- 11x1,190/- 10x1,320/- 10x1,350/- රු.100,040/-**

**03. අධ්‍යාපන සුදුසුකම් :**

ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව, විද්‍යාව/ ගණිතය/ තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම;

*සහ*

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**04. වෘත්තීය සුදුසුකම් :**

(i.) මොරටුව විශ්වවිද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව (ස්වයං චලන යාන්ත්‍රණ ක්ෂේත්‍රයට අදාළ);

*හෝ*

(ii.) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (ස්වයං චලන යාන්ත්‍රණ ක්ෂේත්‍රයට අදාළ);

*හෝ*

(iii.) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (ස්වයං චලන යාන්ත්‍රණ ක්ෂේත්‍රයට අදාළ);

*හෝ*

(iv.) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව (ස්වයං චලන යාන්ත්‍රණ ක්ෂේත්‍රයට අදාළ);

*හෝ*

(v.) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම (මෝටර් ඉංජිනේරු විද්‍යා විෂයය සමග);

*හෝ*

(vi.) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම (ස්වයං චලන යාන්ත්‍රණ ක්ෂේත්‍රයට අදාළ);

*හෝ*

(vii.) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**05. පළපුරුද්ද :**

සෑම අයදුම්කරුවකුම ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම ලැබීමෙන් අනතුරුව, රජයේ හෝ සංස්ථාපිත/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති, සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල්, අවම වශයෙන් සේවකයන් 10 දෙනකු වෙනුවෙන් ගෙවනු ලබන මෝටර් වාහනවල ඩීසල් හා පෙට්‍රල් එන්ජින්, ගියර් පෙට්ටි, ඩිෆරන්ෂල්, තිරිංග පද්ධති, විදුලි පද්ධති, අවලම්භන පද්ධති ආදි සියලු කොටස් අලුත්වැඩියාවන් ඉටු කරනු ලබන පිළිගත් මෝටර් ගරාජයක ස්වයං චලන යාන්ත්‍රණ ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු 02ක අධීක්ෂණ මට්ටමේ පළපුරුද්දක් ලබා තිබීම.

**06. කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

**07. වෙනත් :**

(i.) සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

(ii.) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii.) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

(iv.) ආබාධිත රථ හැර, මෝටර් සයිකල්(A), මෝටර් කෝච්(D) සහ බර මෝටර් ලොරි(CE) පැදවීම සඳහා වලංගු රියදුරු බලපත්‍රයක් අයදුම්පත් භාරගන්නා දිනට සෑම අයදුම්කරුවකුගේම සන්තකයේ තිබිය යුතු ය.

(v.) අයදුම්පත් භාරගන්නා දිනයේදී සියලු අයදුම්කරුවන් විසින් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

***සටහන :*** ඉහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සියලු නිලධාරින්ට ද මේ සඳහා ඉල්ලුම් කළ හැක.

**08. වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 35ට නොවැඩි විය යුතුය. (ඒ අනුව,

2007.12.28 දින හෝ ඊට පෙර සහ 1990.12.28 දින හෝ ඊට පසු උපන්දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

*සටහන :* **දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාවේ බලපෑමක් ඇති නොවේ.**

**09. බඳවාගැනීමේ ක්‍රමය :**

පවත්නා සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාවම විවෘත පදනම මත බඳවා ගනු ලබන අතර, ලිඛිත තරග විභාගයක හා සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව, බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර, සුදුස්සන් තෝරාගනු ලැබේ.

**10. ලිඛිත විභාගය :**

| *ප්‍රශ්න පත්‍රය* | | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 1. | මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය දැනුම. | පැය 02 | 100 | 40% |
| 2. | අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |

විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ සාමාන්‍ය දැනුම | පහත සඳහන් කාර්මික ක්ෂේත්‍රයන් පිළිබඳ මූලික දැනුමක් සහ එම ක්ෂේත්‍රයන්ට අදාළ දෝෂ පිළිබඳ මූලික අවබෝධය<br><br>1. ඩීසල් හා පෙට්‍රල් එන්ජිමක ක්‍රියාකාරීත්වය හා ප්‍රතිධානය<br>2. ක්ලචය හා සම්ප්‍රේෂණ පද්ධතිය<br>3. ස්නේහක පද්ධතිය හා සිසිලන පද්ධතිය<br>4. විදුලි පද්ධතිය<br>5. පෙට්‍රල් හා ඩීසල් වාහනවල ඉන්ධන පද්ධති<br>6. පා තිරිංග පද්ධතිය, රෝදක කාර්යක්ෂමතා පරීක්ෂා කිරීමේ උපකරණ පරීක්ෂා කිරීම, ප්‍රතික්‍රියා කාලය, නැවැත්වීමේ දුර<br>7. අත් තිරිංග පද්ධතිය<br>8. රෝද එක එල්ල හා සුක්කානම් ජ්‍යාමිතිය පරීක්ෂා කිරීමේ උපකරණ<br>9. අවලම්බන පද්ධතිය<br>10. මෝටර් වාහනයක තත්ත්ව වාර්තාවක් පිළියෙල කිරීම<br>11. මෝටර් වාහනයක යෝග්‍යතා නිකුත් කිරීම<br>12. දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය හා මෝටර් වාහන පරීක්ෂකවරයකුට අදාළ රාජකාරි පිළිබඳ සාමාන්‍ය දැනීම<br>13. පින්තාරු කිරීම, පෑස්සීම හා වෑද්දීම පිළිබඳ සාමාන්‍ය අවබෝධය<br>14. ස්වයංක්‍රීය සම්ප්‍රේෂණය |
| අභියෝග්‍යතාව | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සංඛ්‍යානමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් සමන්විත වේ. |

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**11. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ :**

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා නොදෙන අතර, සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

**12. විභාග ගාස්තුව :**

විභාග ගාස්තුව රු. 1,200/-ක් වේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon );

*සටහන :*

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**13. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරුවන් විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම්කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**14. විභාගයට ඇතුළත් වීම :**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී/ සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේදී පෙනී සිටින දින එහි ශාලාධිපතිවරයාට භාර දිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාගය

සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට්* පත්‍රයේ මුල පළ කර ඇත.

(ඇ) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරන ලද නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

(ඉ) විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ තීරණය අවසන් තීරණය වේ.

**15. අපේක්ෂකයාගේ අනන්‍යතාව :**

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොත් සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**16. සැලකිය යුතු ය :**

ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**17. පත්කිරීම සඳහා තෝරාගැනීම :**

ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාව අනුපිළිවෙළ අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර, සුදුස්සන් තෝරාගනු ලැබේ.

**18. ප්‍රතිඵල නිකුත් කිරීම :**

අදාළ ප්‍රතිඵල ලේඛනය "මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදුකරනු ඇත.

**19. සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම්, යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම්, ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

**20.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේ දී යම් නොගැළපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

**කමල් අමරසිංහ,**
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්.

2026 පෙබරවාරි 27 වැනි දින,
මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

02 - 505

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.